(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 249.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2018 මාර්තු 23 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා**, කථානායකතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**, නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා**, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා**, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා**, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා**, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**, රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා**, ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා**, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා**, කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා**, ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා**, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා**, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **මංගල සමරවීර මහතා**, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා**, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ලාල් ග්‍රේරු මහතා,** උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුත්තු සිවලිංගම් මහතා,** ප්‍රාථමික කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා, ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු සිසිර කුමාර අබේසේකර මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු ඩුලිප් විජේසේකර මහතා**

**ගරු කංචන විජේසේකර මහතා**

**ගරු හේෂාන් විතානගේ මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු කුමාර වෙල්ගම මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු සන්දිත් සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා**

**ගරු චතුර සංදීප සේනාරත්න මහතා**

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**

**ගරු කනක හේරත් මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2016 වර්ෂය සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුහසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින්, 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා විසින්, 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා විසින්, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 16 දිනැති අංක 2062/47 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2017 දෙසැම්බර් 15 දිනැති අංක 2049/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා, එම නියමය ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. පෙත්සම් :**

(i) දර්ගා නගරය, කුට්ටිවැලිගොඩ, "උදය" යන ලිපිනයෙහි පදිංචි ජී. අයි. ඩී. රාජිත මධුසංක යහම්පත් මහතාගෙන් ලැබුණු 2018.01.15 දිනැති පෙත්සම;

(ii) අලව්ව, දොඩම්කුඹුරවත්ත, අංක 344 දරන ස්ථානයෙහි පදිංචි මතුගමගේ පේමරත්න මහතාගෙන් ලැබුණු 2017.08.18 දිනැති පෙත්සම; සහ

(iii) අනුරාධපුර, පණ්ඩුලගම, අංක 45 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලියු. ඒ කසුන් එරංග ජයසේකර මහතාගෙන් ලැබුණු 2017.10.27 දිනැති පෙත්සම

ගරු දුමින්ද දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. අග්‍රවිනිශ්චයකාරවරයාගේ සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය :** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ ද අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ ද වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2018.02.17 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2018.02.20 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව අග්‍රවිනිශ්චයකාරවරයාගේ සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් හා දීමනා 2018.01.01 දින සිට පහත පරිදි ප්‍රතිශෝධනය කිරීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 3/2017හි දක්වා ඇති අග්‍රවිනිශ්චයකාරවරයාගේ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ, අභියාචනාධිකරණයේ සභාපතිවරයාගේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ වැටුප්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් පිළියෙළ කර ඇමුණුම් අංක I ලෙස ඉදිරිපත් කර ඇති ලේඛනයේ සඳහන් පරිදි 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රතිශෝධනය කිරීම සහ වැටුප් පරිවර්තනය පියවරෙන් පියවර පදනම මත සිදු කිරීම;

(ආ) මෙතෙක් වැටුපෙන් 25% ක් වශයෙන් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් සහිත දීමනාව 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 50% දක්වා වැඩි කිරීමත්, එම දීමනාව නව වැටුප අනුව ලබන වැටුප් පියවර පදනම් කර ගණනය කිරීම; සහ

(ඇ) මසකට රු.15,000/- ක් වශයෙන් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් රහිත විශේෂ දීමනාව වෙනුවට, මසකට රු. 150,000/- ක විශ්‍රාම වැටුපට ගණන් ගැනෙන වෘත්තීය දීමනාවක් ගෙවීම.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව අග්‍රවිනිශ්චයකාරවරයාගේ සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් හා දීමනා ඉහත සඳහන් පරිදි ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

ඇමුණුම I

**ගරු අග්‍රවිනිශ්චයකාරවරයා හා උපරිමාධිකරණ විනිසුරුවරුන් සඳහා 2018.01.01 දින සිට අදාළ කරගත යුතු වැටුප් පරිමාණයන්**

| සේවා ශ්‍රේණිය | | | අභියාචනාධිකරණ විනිසුරුවරුන් | ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්/ අභියාචනාධිකරණයේ සභාපති | අගවිනිසුරු |
|---|---|---|---|---|---|
| Service Category | | | Appeal Court Judges | Pulsne Judges/ President CA | Chief Justice |
| වැටුප් කේත අංකය | | | ජේ.එස්. 3 - 2016 | ජේ.එස්. 4 - 2016 | ජේ.එස්. 5 - 2016 |
| Salary Code | | | JS 3-2016 | JS 4-2016 | JS 5-2016 |
| 1 | 2 | 3 | 4 | 4 | 4 |
| | | | 6,750 | 7,000 | 7,500 |
| | | | 5 | 5 | 5 |
| | | | | | |
| | | | | | |
| 1 | | | 135,000 | 140,000 | 150,000 |
| 2 | | | 141,750 | 147,000 | 157,500 |
| 3 | | | 148,500 | 154,000 | 165,000 |
| 4 | | | 155,250 | 161,000 | 172,500 |
| 5 | | | 162,000 | 168,000 | 180,000 |
| 6 | | | 168,750 | 175,000 | 187,500 |

* මෙතෙක් වැටුපෙන් 25% ක් වශයෙන් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් රහිත දීමනාව 2018.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 50% දක්වා වැඩි කිරීමත්, එම දීමනාව නව වැටුප අනුව ලබන වැටුප් පියවර පදනම් කොට ගණනය කිරීම.

** මසකට රු.15,000/- ක් වශයෙන් ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් රහිත විශේෂ දීමනාව වෙනුවට රු.150,000 ක විශ්‍රාම වැටුපට ගණන් ගැනෙන වෘත්තීය දීමනාවක් ගෙවීම.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. සක්‍රීය බැරකම් කළමනාකරණය කිරීමේ පනත් කෙටුම්පත :** දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කළේය.

(පූ. භා. 11.29 ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.00 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.21 ට ගරු මුජිබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය"යි රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.02 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

(අ. භා. 5.40 ට කථානායකතුමා මූලාසනාරූඪ විය.)

රැස්වීම තාවකාලිකව අත්හිටවීම

අ.භා. 6.05

අ.භා. 6.35 වන තෙක් රැස්වීම තාවකාලිකව අත්හිටවන ලදී.

අ.භා. 6.35

රැස්වීම යළිත් එක්රැස්වූයෙන් කථානායකතුමා මූලාසනාරූඪ විය.

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව 43 වැනි ස්ථාවර නියෝගය යටතේ පක්ෂව 53; විරුද්ධව 2 යනුවෙන් බෙදී එය සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 3 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"1. මේ පනත 2018 අංක      දරන සක්‍රීය වගකීම් කළමණාකරණය";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2 වැනි වගන්තිය සභා සම්මත විය.

3 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 1 වැනි පිටුවේ 12 වැනි පේළියේ සිට 24 වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව ) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"3. පාර්ලිමේන්තුව විසින්, යම් නිශ්චිත මුදල් වර්ෂයක් තුළ දී, කලින් කලට, ආණ්ඩුවේ රාජ්‍ය ණය, ප්‍රතිමූල්‍යනය කිරීමේ සහ පූර්ව මූල්‍යනය කිරීමේ

කාර්ය සඳහා, ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් (422 වැනි අධිකාරය වූ) මුදල් නීති පනතේ,(417 වැනි අධිකාරය වූ) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ, (420 වැනි අධිකාරය වූ) ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ හෝ 1957 අංක 29 දරන විදේශීය ණය පනතේ විධිවිධාන ඇතුළුව මුදල් එකතු කර ගැනීම සඳහා අදාළ වන නීති ප්‍රකාරව, එම මුදල් වර්ෂයට ඉහතින් වූ මුදල් වර්ෂයේ අවසානයට ගෙවීමට ඉතිරිව ඇති සමස්ථ ණයෙන් සියයට දහයක් නොඉක්ම විය යුතු මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකාව තුළින් හෝ ඉන් පිටතින් හෝ ණය මුදලක් ලෙස එකතු කර ගැනීම සඳහා යෝජනා සම්මතයක් මඟින් අනුමතය ලබා දෙනු ලැබිය හැකි ය'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

4 වැනි වගන්තියේ සිට 8 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

9 වැනි වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 4 වැනි පිටුවේ 5 වැනි පේළියේ සිට 18 වැනි පේළි (ඒ පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''සද්භාවයෙන් සිදුකරන ලද ක්‍රියාවන් සඳහා ආරක්ෂාව.

9. (1) මුදල් මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකු හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයෙකු, හෝ සේවකයෙකු, ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් දරන ලද යම් හානියක් හෝ පාඩුවක් සඳහා එම හානිය හෝ පාඩුව ඔහුගේ විෂමාචාරය හෝ සිතාමතා සිදු කරන ලද පැහැර හැරීමක් හේතුවෙන් සිදු වුයේ නම් මිස වගකීමට යටත් නොවිය යුතුය.

(2) මුදල් මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයෙකු, හෝ සේවකයෙකු, ඔහුගේ විෂමාචාරය හෝ සිතාමතා කරන ලද පැහැර හැරීම හේතුවෙන් සිදු වූ බවට මුදල් මණ්ඩලය විසින් සලකනු ලබන යම් හානි හෝ වියදම් හැර, ඔහුගේ කාර්යය ඉටු කිරීමේ දී ඔහු විසින් දරන ලද සියලු හානි සහ වියදම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හානි පූරණය කළ යුතුය.'';

''සංශෝධනය පිළිගත යුතුය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

10 වැනි වගන්තියේ සිට 15 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

දීර්ඝ නාමය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : දීර්ඝ නාමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

''ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ණය කළමණාකරණය කරනු පිණිස සක්‍රීය වගකීම් කළමණාකරණය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත

හෝ ණය එකතු කර ගැනීමට බලය ලබා දීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.";

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"දීර්ඝ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය

"ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

නාමය

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 5 වැනි පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

"මෙම පනත සක්‍රීය වගකීම් කළමනාකරණ පනත" ලෙස හඳුන්වනු ලැබේ.

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"නාමය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**5. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1) :** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2) :** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 15 දිනැති අංක 2045/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3) :** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 15 දිනැති අංක 2045/33 දරන අති විශේෂ

ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 4) :** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 22 දිනැති අංක 2046/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 5) :** මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 28 දිනැති අංක 2047/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.02.22 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය යුතුය"යි රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 6.49 ට ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.)

**10. කල් තැබීම (විශ්ව විද්‍යාලවල අනධ්‍යයන කාර්ය මණ්ඩල විසින් ආරම්භ කර ඇති අඛණ්ඩ වැඩ වර්ජනය) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි , පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 7.08 ට, 2018 අප්‍රේල් 03 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.